{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත**
**மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்**
**Department of Education – North Central Province**

| 10 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 03 යි |
|---|---|---|

විෂයය :- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I & II

පාසලේ නම :- ..........................................

ඇතුළත්වීමේ අංකය :- ..........................................

- සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1) ගුණාත්මක දත්තයක් පිළිබඳව කියවෙන ප්‍රකාශය කුමක්ද ?
   (1) ගාල්ල සිට මාතරට ඇති දුර ප්‍රමාණය කිලෝමීටර 104 කි.
   (2) දනුෂි ගණිත විෂයට ලබාගෙන ඇති ලකුණු ප්‍රමාණය 75 කි.
   (3) ශලිදු සුදු පැහැයෙන් යුක්තය.
   (4) ඉහත කිසිවක් නොවේ.

2) බැංකු චෙක්පතක නිරවද්‍යතාව පරීක්ෂා කිරීමේ දී භාවිත කරනු ලබන උපාංගය ලෙස හඳුනා ගත හැක්කේ,
   (1) ප්‍රකාශ අනුලක්ෂණ කියවනය (OCR)
   (2) චුම්බක තීන්ත අනුලක්ෂණය කියවනය (MICR)
   (3) තීරුකේත කියවනය (BARCODE READERS)
   (4) චුම්බක අනුනාද මූර්ජන යන්ත්‍රය (MRI)

3) දත්ත ආදානය සඳහා යතුරු පුවරුව (KEY BOARD) හා මූසිකය (MOUSE) හඳුන්වා දුන් පරම්පරාව කුමක්ද?
   (1) පළමු පරම්පරාව (2) දෙවන පරම්පරාව
   (3) තෙවන පරම්පරාව (4) සිව්වන පරම්පරාව

4) විශාලත්වය අනුව පරිගණක වර්ගීකරණයට අයත් නොවන පිළිතුර කුමක්ද?
   (1) සුපිරි පරිගණක (SUPER COMPUTERS)
   (2) මධ්‍ය පරිගණක (MINI COMPUTERS)
   (3) ඇපල් පරිගණක (APPLE COMPUTERS)
   (4) මහා පරිගණක (MAIN FRAME COMPUTERS)

5) දෘඪ පිටපතක් ලෙස හඳුනා ගත හැක්කේ,
   (1) අන්තර්ජාලයෙන් බාගත (DOWNLOAD) කරගත් ගොනුවක්
   (2) සංයුක්ත තැටියක (CD) අඩංගු ගොනුවක්
   (3) පරිගණකයෙන් සකසා මුද්‍රණය කරන ලද තොරතුරක්
   (4) ඊ-මේල් පණිවිඩයකට සම්බන්ධ කළ (ATTACHMENT) ගොනුවක්

6) පහත දක්වා ඇති මුද්‍රණ යන්ත්‍ර අතුරින් වඩාත් වේගවත්ම මුද්‍රණ යන්ත්‍රය ලෙස හඳුනාගත හැක්කේ,
   (1) තීන්ත විදුම් මුද්‍රකය (Ink jet printer ) (2) තිත් න්‍යාස මුද්‍රකය (Dot matrix printer)
   (3) ලේසර් මුද්‍රකය (Laser printer) (4) තාප මුද්‍රකය (Thermal printer)

7) ආචයන උපාංග වල ධාරිතාවය මැනීමට යොදාගනු ලබන ඒකකයන් අඩුම ධාරිතාවයේ සිට වැඩිම ධාරිතාවයට පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,
   (1) Bit, Byte, Kilobyte, Megabyte, Gigabyte
   (2) Byte, Kilobyte, Megabyte, Gigabyte, Bit
   (3) Bit, Byte, Megabyte, Kilobyte, Gigabyte
   (4) Bit, Byte, Gigabyte, Megabyte, Kilobyte



CamScanner

8) දත්ත සන්නිවේදනයක තිබිය යුතු ප්‍රධානම සංරචක තුන නිවැරදි අනුපිළිවෙළට දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) දත්ත යවන්නා, දුරකතන මාධ්‍යය , දත්ත ග්‍රාහකයා
(2) දත්ත ප්‍රභවය, සම්ප්‍රේෂණ මාධ්‍ය, දත්ත ග්‍රාහකයා
(3) සම්ප්‍රේෂණ මාධ්‍ය, දත්ත ග්‍රාහකයා, දත්ත යවන්නා
(4) දත්ත ග්‍රාහකයා, දුරකතන මාධ්‍යය, දත්ත ප්‍රභවය

9) පහත රූපසටහනින් දැක්වෙන්නේ,

(1) බස් (BUS) ස්ථලකය
(2) මුදු (RING) ස්ථලකය
(3) දැල් (MESH) ස්ථලකය
(4) රුක් (TREE) ස්ථලකය



10) 1438.0 යන සංඛ්‍යාවේ වැඩිම වෙසෙසි සංඛ්‍යාංකය හා අඩුම වෙසෙසි සංඛ්‍යාංකය වන්නේ,

(1) 0 සහ 1 වේ. (2) 1 සහ 0 වේ. (3) 1 සහ 8 වේ. (4) 8 සහ 0 වේ.

11) $177_8$ යන සංඛ්‍යාවට තුල්‍ය වන දශමය සංඛ්‍යාව වන්නේ,

(1) $146_{10}$ (2) $45_{10}$ (3) $125_{10}$ (4) $127_{10}$

12) $10101111_2$ ද්විමය සංඛ්‍යාවට තුල්‍ය වන අෂ්ටමය සංඛ්‍යාව වන්නේ,

(1) $267_8$ (2) $257_8$ (3) $157_8$ (4) $246_8$

13) සිංහල, දෙමළ, වැනි විවිධ භාෂාවල සංකේත නිරූපණය කළ හැකි ප්‍රමිතියකට අනුකූලව සකස් කරන ලද කේත ක්‍රමය තෝරන්න.

(1) EBCDIC කේත ක්‍රමය (2) යුනිකේත ක්‍රමය (3) ඇස්කි කේත ක්‍රමය (4) BCD කේත ක්‍රමය

14) ආදාන 3කින් සමන්විත පරිපථයක් සඳහා නිර්මාණය කරන සත්‍යතා වගුවක පැවතිය හැකි අවස්ථා ගණන නිවැරදිව ප්‍රකාශ වන පිළිතුර කුමක්ද?

(1) 2 කි (2) 4 කි (3) 8 කි (4) 16කි

15) පහත සත්‍යතා වගුවේ F වලින් දක්වා ඇති ප්‍රතිදානයට ගැලපෙන තාර්කික ද්වාරය කුමක්ද?

(1) NOT (2) AND (3) OR (4) NAND

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

16) පහත පරිපථයේ ප්‍රතිදානය නිරූපණය කරනු ලබන බූලීය ප්‍රකාශනය කුමක්ද?




(1) A+B+C (2) A. (B+C) (3) A+ (B.C) (4) A.B.C

17) පහත පරිපථයේ අංක 1 සහ 2 ස්ථාන වලින් පිළිවෙලින් 0 සහ 1 ආදානය වීමට සැලැස් වුව හොත් 3 ස්ථානයේ ප්‍රතිදානය කුමක්ද?

(1) 0 වේ.
(2) 1 වේ.
(3) 0 හා 1 වේ.
(4) ඉහත කිසිවක් නොවේ.




18) පරිශීලකයා තිරය මත දකින ප්‍රථම චිත්‍රක හෝ වදන් ප්‍රතිදානය කරනු ලබන්නේ,

(1) දෘඩාංග මගිනි. (2) මෘදුකාංග මගිනි. (3) ස්ථිරාංග මගිනි. (4) ඉහත සියල්ල මගිනි.



CamScanner

19) සුනාමි අනතුරු අඟවන යන්ත්‍රවල සඳහා වඩාත්ම සුදුසු මෙහෙයුම් පද්ධතිය වන්නේ,

(1) ඒක පරිශීලක (2) බහු පරිශීලක (3) බහු කාර්යය (4) තත්‍යකාල

20) පරිශීලක වෙතට අනවසරයෙන් ඇතුළු වන්නන් පෙන්වා දීම සඳහා මෙහෙයුම් පද්ධතිය මගින් ලබා දෙන පාලන සේවාව අයත් වන්නේ,

(1) ගොනු කළමනාකරණය (2) ජාලකරණ කළමනාකරණය
(3) ආරක්ෂණ කළමනාකරණය (4) උපාංග කළමනාකරණය

21) වදන් සැකසුම් මෘදුකාංග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) Abiword, iwork page, Lyx (2) Wordperfect, openoffice calc, msword
(3) Msword, Lyx, Google docs, Excel (4) Word perfect, iwork page, Libreoffice Impress

22) පහත රූපයේ A,B,C අක්ෂර වලින් දැක්වෙන මෙවලම් පිළිවෙලින් දැක්වෙනුයේ,

A  B  C 

(1) Bold, Font colour, Shading (2) Bullets, Border, Sort
(3) Save, Undo, Re-do (4) Font color, New, Italic

23) ලිපි ලේඛන සැකසීමේ දී අප යොදා ගන්නා වචන වෙනුවට එම අදහස ගෙන දෙන වෙනත් වචන සොයා ගැනීමටත් ඒවා අවශ්‍ය ස්ථානයට යොදා ගැනීමටත් වදන් සැකසුම් මෘදුකාංගයේ ඇති පහසුකම වන්නේ,

(1) Spelling and grammar (2) Thesaurus (3) Find and replace (4) Insert picture

24) නිර්මාණය කරන ලද ආරාධනා පත්‍රයක්, ලිපියක් හෝ සහතිකපතක් කිහිප දෙනෙකුට ලැබීම සඳහා භාවිත කළ හැකි වදන් සැකසුම් මෘදුකාංග මෙවලම කුමක්ද?

(1) Print preview (2) Word Art (3) Mail merge (4) *Thesaurus*

25) වදන් සැකසුම් මෘදුකාංගය තුළ වචන ප්‍රතිස්ථාපනය කිරීම සඳහා යොදා ගන්නා කෙටිමං යතුර වන්නේ,

(1) Ctrl+O (2) Ctrl+H (3) Ctrl+End (4) Ctrl+V

26) පහත වැඩපතට අනුව තෝරා ගත් කොටසට අදාල නිවැරදි කෝෂ පරාසය වන්නේ,

(1) A3:C3
(2) A1:C3
(3) A3:C1
(4) A3:B3:C2




27) Excel හි 6+3*3^2/(9-3) යන සූත්‍රය සුළු කළ පසු ලැබෙන පිළිතුර කුමක්ද?

(1) 8 වේ (2) 10.5 වේ (3) 11.5 වේ (4) 9 වේ

28) පහත දැක්වෙන සූත්‍ර අතුරින් නිවැරදි නොවන සූත්‍රය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) =D2*$E2+G$2 (2) =E2*$E2+H$2 (3) =F2*$E2$+I$3 (4) =G2*E2+J2

29) තෝරාගෙන තිබෙන්නා වූ කදාවක් තිරයේ දැක්වීමට හා කදාවක් තුළ තිබෙන සියලු දේ පැහැදිලිව කියවා බැලීමට සමර්පණ මෘදුකාංගයක දැකිය හැකි දසුන වන්නේ,

(1) සාමාන්‍යා දසුන (normal view) (2) කියවුම් දසුන (reading view)
(3) සුබෙදුම් දසුන (slide sorter view) (4) සූමය (zoom)

30) එක් දෘශ්‍ය රාමුවක සිට තවත් දෘශ්‍ය රාමුවකට මාරු වීම සිදු කර ගත හැකි මෙවලම කුමක්ද?

(1) Master page (2) Animation (3) Transition (4) Layouts

31) මුදල් ගෙවීමකින් තොරව භාවිත කළ හැකි සමර්පණ මෘදුකාංගයකට උදාහරණයකි.

(1) Apple Keynote (2) Open office.org Impress
(3) Microsoft PowerPoint (4) Corel Presentation



CamScanner

32) දත්ත සමුදාය කළමනාකරණ මෘදුකාංගයකට උදාහරණයකි.
(1) MS- Access (2) MS- Publisher (3) Open Office Calc (4) Firefox

33) දත්ත සමුදාය ප්‍රධාන ආකාර දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) සම්බන්ධිත දත්ත සමුදාය හා ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදාය
(2) සංචිත දත්ත සමුදාය හා අත්යුරු දත්ත සමුදාය
(3) ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදාය හා අත්යුරු දත්ත සමුදාය
(4) අත්යුරු දත්ත සමුදාය හා සම්බන්ධිත දත්ත සමුදාය

34) පහත දැක්වෙන්නේ ශලිඳු ආයතනය මගින් විකුණන ලද මෝටර් රථ සම්බන්ධයෙන් වූ දත්ත පාදකයක කොටසකි.

| වාහන අනු අංකය | වාහන වර්ගය | විකුණන ලද වාහන ගණන | වායු සමීකරණය කර ඇත/නැත |
|---|---|---|---|
| S1110 | NISSAN | 45 | YES |
| S1111 | BMW | 52 | NO |
| S1112 | HONDA | 39 | NO |
| A1113 | AXIO | 35 | YES |

ඉහත දත්ත පාදකයේ ප්‍රාථමික යතුරු ක්ෂේත්‍රයක් සඳහා වඩා සුදුසු වන්නේ,
(1) වාහන වර්ගය ක්ෂේත්‍රයයි. (2) වාහන අනු අංකය ක්ෂේත්‍රයයි.
(3) විකුණන ලද වාහන ගණන ක්ෂේත්‍රයයි. (4) වායු සමීකරණය කර ඇත/නැත ක්ෂේත්‍රයයි.

35) ඉහත දත්ත පාදක වගුවේ ක්ෂේත්‍ර හා රෙකෝඩ ගණන පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) 4 හා 5 (2) 5 හා 3 (3) 4 හා 3 (4) 4 හා 4

36) ඉහත දත්ත පාදක වගුවේ වායු සමීකරණය කර ඇත/නැත ක්ෂේත්‍රය සඳහා වඩා උචිත දත්ත ප්‍රරූපය වන්නේ,
(1) Text (2) Boolean (3) Date and Time (4) Real

37) තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ අයහපත් අතුරු ප්‍රතිඵලයක් වන්නේ,
(1) ශාරීරික ක්‍රියාකාරිත්වය අඩුවීමෙන් ස්ථූලභාවය ඇති වීම.
(2) පුස්තකාල නොගොස් නිවසේ සිටම පොත් කියවීමට හැකියාව ලැබීම.
(3) පුද්ගල කටයුතු වඩා කාර්යක්ෂම වීම
(4) තම සෞඛ්‍ය තත්වය නිවසේ සිටම පරීක්ෂා කරගත හැකි වීම.

38) දත්ත වගුවක අඩංගු ප්‍රාථමික යතුරු ක්ෂේත්‍රයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පරිශීලකයාට එකම දත්තය නැවත නැවත ඇතුළත් කළ නොහැකි ය.
(2) ක්ෂේත්‍රය තුළ හිස් ඉඩ පවත්වා ගනී.
(3) අනුපිළිවෙල සැකසුම සිදු නොකරයි.
(4) ක්ෂේත්‍ර ප්‍රමාණය වෙනස් කළ නොහැකි ය.

39) ඇසළ පැන්සල් <u>දෙකක්</u> සහ <u>කුඩා</u> මකන කැල්ලක් තම බෑගයේ දමා ගත්තේය. මෙම වගන්තියේ ඉරි ඇඳි කොටසින් නිරූපණය වන්නේ පහත ඒවායින් කුමක් ද?
(1) ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්තයකි. (2) ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්තයකි.
(3) ගුණාත්මක දත්තයකි. (4) තොරතුරකි.

40) යුනිකේත සම්බන්ධ ව පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර වන්නේ,
A- සෑම අනුලක්ෂණයක් සඳහාම ඊට ම අනන්‍ය වූ අගයක් පවතී.
B- එයින් අනුලක්ෂණ 128 ක් නිරූපණය කළ හැකි ය.
C- අන්තර්ජාල වෙබ් අඩවි සහ පුවත්පත් සඳහා භාවිත කළ හැකි ය.

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි (4) A හා C පමණි



CamScanner

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

1. .

I. $2AB_{16}$ යන සංඛ්‍යාව ද්විමය ආකාරයෙන් ලියා දක්වන්න.

II. පහත දැක්වෙන ජාලකරණ ස්ථලකය කුමක්ද? එහි වාසියක් හා අවාසියක් ලියා දක්වන්න.



III. පහත දැක්වෙන කෙවෙනි සලකන්න.

| Ⓐ | Ⓑ | Ⓒ | Ⓓ | Ⓔ |
|---|---|---|---|---|
|  |  |  |  |  |

a) ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සම්බන්ධ කිරීම සඳහා සුදුසු කෙවෙනි ලේබල ලියා දක්වන්න.

b) අන්තර්ජාලයට සම්බන්ධවීමට භාවිත කළහැකි කෙවෙනි ලේබල ලියා දක්වන්න.

IV. $L=P+\overline{Q}.\overline{R}$ යන ප්‍රකාශනය සඳහා පරිපථයක් ඇද දක්වන්න.

V. නියමු මාධ්‍යක් හා නියමු නොවන මාධ්‍යක් ලියා දක්වන්න.

VI. සඳුන් තම යහළුවාට පවසා සිටිනවා වැඩිම ධාරිතාවයක් ඇති ප්‍රවේශ වේගය අඩුම ආචයන උපාංග වන්නේ A බවත් එය අයත් වන තාක්ෂණය B බවය. එහිදී යහළුවා පවසන්නේ දත්ත ආචයන සඳහා ජනප්‍රියම දැනට භාවිතවන උපාංග C බවත් එය plug and play ලෙස හඳුන්වන අතර එහි තාක්ෂණය D බවය.

ඉහත සංසිද්ධියට අදාළ A හා B වළට ගැලපෙන පිළිතුර පහත ලැයිස්තුවෙන් තෝරන්න.

**ලැයිස්තුව- සැනෙළි මතක/ චුම්බක පටි/ දෘඪ තැටි/ චුම්බක තාක්ෂණය/ ප්‍රකාශ තාක්ෂණය/ ඝන තත්වයේ තාක්ෂණය**

VII. RAM හා ROM අතර වෙනස්කම් 2 ක් ලියා දක්වන්න.

VIII. පරිගණකයේ මොළය ලෙස මධ්‍ය සැකසුම් ඒකකය හඳුන්වනු ලබයි. එහි කොටස් 3 ලියා දක්වන්න.

IX. පහත දී ඇති මෙහෙයුම් පද්ධති වර්ගීකරණය කරන්න.

**Linux/ Windows server/ Ubuntu/ ATM සතු මෙහෙයුම් පද්ධතිය/ Mac OS/ MS DOS/ Windows 10**

| ඒක පරිශීලක ඒක කාර්යය | බහුපරිශීලක - බහුකාර්යය | ඒක පරිශීලක- බහුකාර්යය | තත්‍යකාල |
|---|---|---|---|
| | | | |

X. පහත දැක්වෙන දසුන් වල නම් ලියා දක්වන්න.

| ① | ② | ③ | ④ |
|---|---|---|---|
|  |  |  |  |



CamScanner

2. නිශාන්ත පරිගණකයේ දත්ත නිරූපනය කරන ක්‍රමවේදය චාමික යන මිතුරාට විස්තර කරන විට ඔහු පවසා සිටින්නේ ඒ සඳහා යුනිකේත (Unicode) යන කේත ක්‍රමය භාවිත කරන බවයි.

   I. යුනිකේත මගින් නිරූපනය වන අනුලක්ෂණ ගණන කීයද?
   II. එහි වාසියක් ලියා දක්වන්න.
   III. එහි චාමික පවසන්නේ ඒ සඳහා වෙනත් ක්‍රම තිබූ බවයි. එම කේතන ක්‍රම 2ක් සඳහන් කර ඒ සඳහා භාවිත කරන බිටු ගණන ලියා දක්වන්න.
   IV. $76_8$ යන අෂ්ටමය සංඛ්‍යාව දශමය බවට හරවන්න. පියවර ලියා දක්වන්න.
   V. පහත දී ඇති ආවයන උපාංග ධාරිතාව අනුව ආරෝහණ ආකාරයෙන් ලියා දක්වන්න.
   සංයුක්ත තැටි / සැනෙළි මතක / දෘඪ තැටිය / නම්‍ය තැටි

3. පහත දැක්වෙන පරිපථය සලකන්න.







   I. P සඳහා බූලියානු ප්‍රකාශනයක් ලියා දක්වන්න.
   II. ඒ සඳහා සත්‍යතා වගුවක් ගොඩනගන්න.
   III. පහත දී ඇති K නැමැති විද්‍යුත් පරිපථයට ආදළ තාර්කික පරිපථය කුමක්ද?
   IV. ඒසඳහා සත්‍යතා වගුවක් ඇඳ දක්වන්න.

4. පහත දැක්වෙන පරිගණක අතුරු මුහුණත සලකන්න.




   I. ඉහත දැක්වෙන අතුරුමුහුණත් වර්ගය කුමක්ද? මෙවැනි අතුරුමුහුණතක් භාවිත කරන මෙහෙයුම් පද්ධති 2ක් ලියා දක්වන්න
   II. එවැනි මෙහෙයුම් පද්ධතියක භාවිත කරන සංරචක මොනවාද?
   III. මෙහෙයුම් පද්ධති වල ඇති වෙනත් අතුරුමුහුණත් වර්ගයක් ලියා එයට එක් උදාරණයක් ලියන්න.
   IV. මෘදුකාංග වර්ග කළ හැකි ප්‍රධාන ආකාර 2ක් ඇත. ඒවා ලියා දක්වන්න.
   V. ඉහත දක්වා ඇති රූප සටහනේ දැක්වෙන උපයෝගිතා මෘදුකාංගයක් ලියා එහි කාර්යය ලියා දක්වන්න.
   VI. එහි ඇති ගොනු භාවිත කර පහත වගුව පුරවන්න.

| ගොනු නාමය | ගොනු දිගුව | නිර්මාණය කළ මෘදුකාංගය |
|---|---|---|
| | | |



CamScanner

5. (අ) පහත දක්වා ඇති රූප සටහන සලකන්න.







I. ABCDE යන ලේබල සඳහා සුදුසු මෙවලම් වලට ඇති ලේබල අංකය ලියා දක්වන්න.

II. ❶ ලේබලයට අදාළ අයිකනය හඳුන්වා එහි භාවිතය ලියා දක්වන්න.

III. ❿ ප්‍රධාන කාර්යය ලියා දක්වන්න.

IV. Ravi Company ලෙස Watermark එකක් ලබා ගැනීමට සුදුසු ලේබල අංකය වන්නේ

V. ❼ ලේබලයට අදාළ අයිකනය හඳුන්වා එහි භාවිතය ලියා දක්වන්න.

(ආ) පහත දැක්වෙන වගුව භාවිතයෙන් ඒවායේ කාර්යයන් නිවැරදිව ගලපා දී ඇති ලේබල භාවිත කරමින් ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| A | ගුරු පිටුව | ❶ | පෙර සැකසූ කදා තෝරා ගත හැකිය |
| B | කදා පිරිවැසුම | ❷ | සම්පූර්ණ සමර්පණය එකම ආකාරයකට හා එහි හැඩය සකසා ගත හැකිය |
| C | කදා පසුතලය | ❸ | පාඨ චිත්‍රක සඳහා චලන ඇතුළත් කිරීම |
| D | සජීවීකරණ කවුළුව | ❹ | කදාවේ පසුබිමට විවිධ වර්ණ ඇතුළත් කරයි. |



CamScanner

6. පහත දැක්වා ඇත්තේ 2023 විභාග ප්‍රතිඵල පැතුරුම්පත් ලේඛනයකි. එම පැතුරුම්පත භාවිත කර පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Student Name | Science | Maths | English | Sinhala | History | Religion | Total | Average |
| 2 | Chanaka | 82 | 85 | 78 | 85 | 80 | 80 | | |
| 3 | Gayan | 78 | 80 | 79 | 72 | 78 | 67 | | |
| 4 | Janith | 88 | 78 | 69 | 85 | 82 | 65 | | |
| 5 | Lakruwan | 69 | 90 | 70 | 77 | 79 | 60 | | |
| 6 | Idumini | 70 | 85 | 78 | 70 | 86 | 69 | | |
| 7 | Arundya | 69 | 80 | 30 | 79 | 79 | 70 | | |
| 8 | වැඩිම ලකුණු | | | | | | | | |
| 9 | අඩුම ලකුණු | | | | | | | | |

I. මෙහි මුළු ලකුණු වල එකතුව ලබා ගැනීමට H2 කෝෂය සඳහා සමීකරණයක් ලියා දක්වන්න.

II. එහි I2 සාමාන්‍ය අගය සෙවීම සඳහා සුදුසු ශ්‍රිතයක් ලියා දක්වන්න.

III. ගණිතය විෂය සඳහා වැඩිම ලකුණු ලබා ගැනීමට C8 සඳහා ශ්‍රිතයක් ලියා දක්වන්න.

IV. ඉතිහාසය (History) විෂය සඳහා අඩුම ලකුණු ලබා ගැනීමට F2 සඳහා ශ්‍රිතයක් ලියා දක්වන්න.

V. H2 සඳහා ලියන ලද සමීකරණය H7 දක්වා පිටපත් කළ හැකි ආකාරය ලියා දක්වන්න.

VI. වෙනත් පැතුරුම්පතක, B4 කෝෂයේ =$B3+B2 සූත්‍රය ඇතැයි උපකල්පනය කරන්න. එම සූත්‍රය C5 කෝෂයට පිටපත් කළේ නම් C5 කෝෂයේ දිස්වන සූත්‍රය ලියා දක්වන්න.

7. පහත දක්වා ඇති දත්ත සමුදාය සලකන්න.

| PID | Pname | address | WId |
|---|---|---|---|
| P01 | Janaka | Anuradhapura | W01 |
| P02 | Thasith | Rambewa | W03 |
| P03 | kalpa | Anuradhapura | W02 |
| P04 | lalith | Mihinthale | W01 |

Patient table

| WId | Wname |
|---|---|
| W01 | General |
| W02 | Maternity |
| W03 | Children |
| W04 | paediatric |

Ward table

| DoctorNo | Dname | teleNo |
|---|---|---|
| 101 | Lakmal silva | 071 2013002 |
| 102 | Neeta kumari | 070 2303024 |
| 103 | Lakshman bandara | 071 5632000 |

Doctor table

| WId | DoctorNo | Hours |
|---|---|---|
| W01 | 102 | 5 |
| W02 | 103 | 8 |
| W03 | 102 | 8 |
| W01 | 102 | 3 |
| W03 | 103 | 8 |

Doctorward table

I. Doctorward හි ක්ෂේත්‍ර සඳහා සුදුසු දත්ත ප්‍රරූප ලියා දක්වන්න.

II. Patient වගුවේ ක්ෂේත්‍ර ගණන හා රෙකෝඩ ගණන ලියා දක්වන්න.

III. සියළු වගු සඳහා ප්‍රාථමික යතුර එහි වගු නාමයන් සමගින් ලියා දක්වන්න.

IV. ආගන්තුක යතුරක් වගු නාමයන් සමගින් ලියා දක්වන්න.

V. රෝහලට Nalaka Wickramathunga නැමැති නව වෛද්‍යවරයෙකු පැමිණි විට ඔහුට 104 යන අංකය ලබා දී 071 2344567 යන දුරකථන අංක ලබා දී ළමා වාට්ටුවේ පැය 8 ක් සඳහා අනුයුක්ත කිරීමේ දී යාවත්කාලීන වන වගුවේ/වගු නාම හා රෙකෝඩ ලියා දක්වන්න.

වගුව —>(ක්ෂේත්‍ර නාම1, ක්ෂේත්‍ර නාම2, ක්ෂේත්‍ර නාම3)

සැකසුම - ඩී.එස්.අයි. දේවකළුආරච්චි, ගුරු උපදේශක



CamScanner